# ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන සමඟ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 09 ප්‍රකාර විධිමත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

#### 1.2.2 නීති, රීති, රෙගුලාසි යන ආදියට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරී පනත 19(3) වගන්තිය | අදාල නියමයන්ට අනුව අධිකාරිය විසින් ජාතික ව්‍යවසාය සංවර්ධන අරමුදලක් පිහිටුවා තාක්ෂණ සංවර්ධන කාර්යයන් සඳහා වෙන් කරන ලද හෝ ලැබෙන සියළු මුදල් එම අරමුදලට බැර විය යුතු බව දක්වා තිබුණද, එම නියමයන්ට අනුකලව කටයුතු කර නොතිබුණි. |

(ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

| | |
|---|---|
| 5.2.1 වගන්තිය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයවැය ප්‍රකාශන පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි |
| 6.5.1 වගන්තිය | 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2012 ජූනි 28 දිනදීය. එනම් මාස 04 ක් ප්‍රමාදවීමෙන් පසුවය. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලින් රු.530,441 ක අතිරික්තයක් වූ අතර ඊට එරෙහිව ඉකුත් වර්ශයේ ඌනතාවය රු. 1,759,693 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,290,134 ක වාසිදායක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

#### 2.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් රු.10,521,203 කින් හෙවත් 120 % කින් වැඩි වුවද පුනරාවර්තන වැය සඳහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රදාන සහ විලම්භීත ප්‍රාග්ධන ආදායම රු.21,654,073 කින් හෙවත් 113 % කින් වැඩිවීම මෙම මෙහෙයුම් ප්‍රතිඵලයේ රු. 2,290,134 ක් වූ වාසිදායක වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 පෙබරවාරි 04 දින එවකට සිටි සභාපතිවරයාට අනුයුක්ත කරදී තිබූ වාහනයක් ඔහු දිවයිනෙන් බැහැරව සිටින ලද අවස්ථාවකදී රියදුරු නොවන තැනැත්තෙකු විසින් ධාවනය කිරීමේදී අනතුරකට භාජනය වී තිබුණි. අනතුරෙන් සිදුවූ අලාභය අදාල පුද්ගලයා විසින් දරා ඇති හෙයින් හා එමගින් අධිකාරියට මූල්‍යමය අලාභයක් සිදු නොවූ සේ සලකා ඉතිරි ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොතිබුණි. රාජ්‍ය ආයතනයට අයත් යම් වත්කමක් අනතුරට භාජනය වූ විට අනුගමනය කළයුතු ක්‍රියාපරිපාටිය මු. රෙ. 101 සිට 113 දක්වා ඇති හෙයින් අනතුරට අදාල වගකිවයුතු නිලධාරීන් නිෂ්චය කිරීම, අලාභයේ ප්‍රමාණය නිෂ්චය කිරීම, අලාභය අයකර ගන්නා ආකාරය, පොලිස් වාර්තාවේ පිටපත් ලබාගැනීම ආදී ලෙස වූ විධිමත් ක්‍රියා මාර්ග කිසිවක් අධිකාරිය විසින් මෙම අනතුර සම්බන්ධයෙන් අනුගමනය කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් 2008 වර්ෂයේ සිට උපදේශකයෙකුගේ සේවය ලබාගෙන තිබුණු අතර, 2011 වර්ෂය තුලදී උපදේශක ගාස්තු ලෙස මසකට රු.60,000 බැගින් රු.720,000 ක් ගෙවා තිබුණි. නමුත් අදාල උපදේශක විසින් සපයන ලද සේවාවන්, ඔහු විසින් පිළියෙල කළ වාර්තා, සිදුකළ අධීක්ෂණයන් හෝ ප්‍රක්ෂේපන කටයුතු ආදිය පිළිබඳව අන්තර්ගත වාර්තාවක් 2011 වර්ෂයට අදාලව ලබාදී නොතිබූ බැවින් ගෙවන ලද මෙම උපදේශක ගාස්තු අධිකාරියට නිශ්කාර්ය වියදමක් බැව් විගණනයේදි බැහැර කල නොහැකි විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුලදී අධිකාරිය විසින් පෞද්ගලික සමාගමට අයත් ගොඩනැගිල්ලකින් වර්ග අඩි 4,441 ක් සඳහා රු. 4,382,072 ක් ගෙවා ලබාගෙන කාර්යාල පරිශ්‍රයේ කාමර වෙන්කිරීම් ආදිය වෙනුවෙන් රු. 3,240,149 ක් අධිකාරියේ අරමුදලින් දරා තිබුණි.

## 4. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම අනුව, ක්‍රියාකාරකම් 15 ක් සඳහා රු. මිලියන 23 ක වටිනාකමක් දක්වා තිබුණද, වාර්ෂික අයවැය ඇස්තමේන්තුව තුළ වැය විෂයය අංක 2107 සඳහා පමණක් රු. මිලියන 23 ක මුදලක් වෙන් කර තිබුණි. වැය විෂයය අංක 2107, (වෙනත් වියදම්) යටතේ විෂයයන් 10 ක් සඳහා කිසිදු ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නොතිබුණි.තවද සංයුක්ත සැලැස්මෙන් ඉදිරිපත් කළ කාලපරිච්ඡේදය සඳහා ව්‍යවසාය සංවර්ධන විෂය පථය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම තුල 03 වන ක්‍රියාකාරකම ලෙස දක්වා තිබූණු ඵලදායීතා වැඩිදියුණු කිරීම යටතේ වූ විෂයයන්ට අදාලව වාර්ෂික අයවැය ලෙස ඉදිරිපත් කළ වියදම් ඇස්තමේන්තුව තුල ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, ක්‍රියාකාරී සැලැස්ම තුල දක්වා තිබුණු 04 වැනි ක්‍රියාකාරකම සඳහා රු. මිලියන 0.5 ක් වර්ෂයේ (Cleaner Production) අවසාන කාර්තු දෙකට අදාලව දක්වා තිබුණ. නමුත් වාර්ෂික අයවැය ඇස්තමේන්තු තුල ඒ සඳහා ප්‍රතිපාදන නොතිබුණි. ක්‍රියාකාරී සැලැසමෙ 05 වැනි ක්‍රියාකාරකම සඳහා රු. මිලියන 02 ක් 2011 වර්ෂයේ මුල් කාර්තු දෙකට වෙන්කර තිබුණු අතර, වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ රු.මිලියන 11.4 ක් 2011 වර්ෂයට අදාලව දක්වා තිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ 06 වැනි ක්‍රියාකාරමේ 6.1 සිට 6.5 දක්වා උප විෂයයන්ට අදාලව වාර්ෂික අයවැය තුල රු.මිලියන 05 ක දක්වා තිබුණද, එක් එක විෂයයට අදාල මූල්‍ය වටිනාකම නිශ්චිතව සැසඳෙන අකාරයෙන් ඉදිරිපත් කර නොතිබුණ. එසේම 7 වැනි හා 8 වැනි ක්‍රියාකාරකම් සඳහා මුදල් වෙන්කිරීම් වාර්ෂික අයවැය තුළ කුමන විෂයයක මගින් සිදුකරන්නේද යන්න නිශ්චිතව ඉදිරිපත් කර නොතිබුණි.

මේ අනුව සංයුක්ත සැලැස්ම පාදක කර ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ලේඛණය සකසා නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

4.2 **අයවැය පාලනය**

2011 වර්ෂයට අදාල තථ්‍ය ආදායම් හා වියදම් ඇස්තමේන්තුගත වටිනාකම් අතර සැලකිය යුතු විචලතාවයන් දක්නට තිබුණු බැවින් වියදම් ඇස්තමේන්තුව ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට කළමනාකාරීත්වය අපොහොසත්වී තිබුණු බැව් විගණනයේදී නිරීක්ෂණය විය.

5. **පද්ධති හා පාලන**

විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත දැක්වෙන පාලන කෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) කාර්ය මණ්ඩලය
(ඇ) අයවැය පාලනය
(ඈ) වියදම් පාලනය

ටීසී/ඩී/එන්ඊඩීඒ/2011/එෆ්ඒ/ඒ/02 2012 දෙසැම්බර් දින.

සභාපති,
ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය.

**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

-------

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

එච්. ඒ.එස්.සමරවීර,
විගණකාධිපති

පිටපත් : 1. ලේකම්, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය .